# පුරාතන ලංකාවේ විහාර ඉඩම්වලට ඇතුළුවීමේදී රාජකීය නිලධාරීන්ට පනවා තිබූ වාරණ පිළිබඳ අත්තාණි ශිලාලේඛන ඇසුරෙන් විමසුමක්

**දිල්රංග ජී. පි. කේ.**[1]

රාජකීයයන් හෝ සාමාන්‍ය ජනතාව විසින් ඕනෑම තරාතිරමක පුද්ගලයෙක් වෙත විහාරාරාම උදෙසා ඉඩම් පරිත්‍යාග කරදීමේ හැකියාවක් පැවති අතර එසේ ප්‍රධානය කරන ලද ඉඩමේ සුරක්ෂාව ද රාජකීයයන් විසින් සැපිරූ බව පෙනෙන්නට තිබේ. මෙමගින් විහාර ඉඩම්වලට ඇතුළුවීමේදී රාජකීය නිලධාරීන්ට පනවා තිබූ වාරණ පිළිබඳ අධ්‍යනය කිරීම අපේක්ෂා මෙහිදී කෙරේ. විහාර සන්තක ඉඩකඩම් ආරක්ෂා වීම සහ ඒවායේ නිදහස් භුක්තිය උදෙසා රාජකීය නිලධාරීන්ගෙන් සිදුවිය හැකි බාධා මැඩපැවැත්වීම උදෙසා සමකාලීන පාලකයන් ගත් ක්‍රියාමාර්ග කොතරම් සාර්ථක වීද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. අධ්‍යන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යනය සිදුකෙරිණි. අත්තාණි ශිලාලිපියකින් බොහෝ දුරට සිදුවන්නේ ආගමික හා මහජන ආයතන වලට අයත් හා ඇතැම්විට පුද්ගලයන්ට අයත් ගම්බිම්වලින් බදු අයකිරීම, රජයේ නිලධාරීන් ඒ ගම්බිම් ආදියට ඇතුළුවීම වැළැක්වීම වැනි වරප්‍රසාද ප්‍රදානය කිරීම ය. පළමුවන උදය රජු විසින් අභයගිරි වෙහෙරෙහි සලපිළිම වහන්සේගේ ගෙයි පහන් වැටි දල්වනු පිණිස තෙල් බද්දක් ගෙවමින් භුක්ති විදින සේ කිතම්බැවැ නම් මහාදිපාද කෙනෙකුට පරිත්‍යාග කරන ලද කොළයුණු නම් ගමකට දුන් නිදහස්කම් ගැන දක්වමින් නෑගම ටැම්ලිපිය ලියවී තිබේ. ''මෙගමට් වැරි පෙරෙනාට්ටු නොවද්නා කොට් ඉසා" ආදී වශයෙන් මෙම ගමට ඇතුළු නොවිය යුතු පුද්ලයන් පිළිබඳ දක්වමින් ගමට නෛතික පදනමක් එක් කිරීමට රජු කටයුතු කර ඇත. මැදිරිගිරි ටැම් ලිපියේ ද මැදිරිගිරි විහාර පියන්ගලට අයත් ඉඩමේ සතර සීමාවට ආණ්ඩුවේ මුලාදෑනීන්ගේ සහ වෙනත් නොවැදියමනා අයගේ ප්‍රවේශය වැලැක්වීමත් අයබදු ගැනීම වැළැක්වීමාදියත් සඳහා ලිපිය පිහිටුවා තිබේ. එහි දක්වන ආකාරයට විහාරය පිහිටි රන්තිසා ගමේ පියන්ගලට අයත් සතර සීමාවට ආණ්ඩුවේ නිලධාරීන් ඇතුළුවීම තහනම් කොට ඇත. කිවුලේකඩ ශිලා ලිපියේ ද පළමු වැනි සේන රජුගේ විධාන පරිදී රාජ්‍ය නිළධාරින්, වාරි බදු හා අතුරු මාර්ග බදු අය කළ නිළධාරින්, රට ලද්දන් හා පස් ලද්දන් රිටිගල විහාරය සතු ඉඩම් වලට ඇතුළු නොවන ලෙස අංගාරක්ෂක නිළධාරියා විසින් වාරණ පනවා ඇත. එමගින් සමකාලීන විහාර ඉඩම් වලට රාජකීයයන්ගෙන් සිදුවිය හැකි බාධක වැළැක්වීමට පවා නිළධාරීන් පත් කර සිටි බව පැහැදිලි වේ. කුමන හෝ තරාතිරමේ පුද්ගලයෙක් වුව මෙකී ගම් වල පනවන ලද නීති ව්‍යවස්ථා හා වාරණ උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත් කර තිබේ. මේ අනුව සාමාන්‍ය ජනතාව වෙත පමණක් නොව රාජකීය නිලධාරදීන්ට පවා යම් යම් වාරණ පනවමින් විහාර ඉඩම් නිදහස්ව භුක්තියේ යෙදවීමට පාලකයන් ගත් ක්‍රියාමාර්ග අත්තානි ශිලා ලේඛන ඇසුරෙන් පැහැදිලි කර ගත හැකිය.

**ප්‍රමුඛ පද :** අත්තාණි, නිළධාරීන්, රාජකීය, වාරණ, විහාර

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
krishmaldilranga1@gmail.com